## උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

### අමාත්‍ය මණ්ඩල සංදේශය

<u>රහස්‍යයි</u>

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: HETI/HE/UD/2019/29

<u>විශ්වවිද්‍යාල හා විශ්වවිද්‍යාල විද්‍යායතන පද්ධතියක් රැකියා අභිමුඛ වෙළඳපල අවශ්‍යතාව පදනම්ව ප්‍රතිව්‍යුහගත කිරීම</u>

## 1. පසුබිම

රට හදන සෞභාග්‍යයේ දැක්ම මධ්‍යකාලීන ආයෝජන ප්‍රතිපත්ති රාමුවේ සිව්වන පරිච්ඡේදයේ මානව සම්පත් සංවර්ධනයේ නව දිශානතියට අනුකූලව ප්‍රඥා සම්පන්න පුරවැසියෙක්: දැනුමෙන් පිරිපුන් සමාජයක්, ස්ථාපනය කිරීම සඳහා වූ ජාතික වැඩපිළිවෙල 2020-2025 වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විටත් ලැබී ඇත.

අප නව රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව දැනට රජයේ විශ්වවිද්‍යාල හා විවිධ උසස් අධ්‍යාපන ආයතනවල දැනටමත් පවතින යටිතල හා මානව සම්පත් ආශ්‍රිතව වාර්ෂිකව ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම අරමුණු කොට, මවිසින් පසුගිය සති 03ක කාලසීමාව ඇතුළත, මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ සියළුම උපකුලපතිවරුන්, උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන්, අප අමාත්‍යශය සතු සියළුම අධ්‍යාපනික හා පර්යේෂණ ආයතනවල ප්‍රධානීන්,තොරතුරු තාක්ෂණ හා ඉංජිනේරු ක්ෂේත්‍ර ආශ්‍රිත පෞද්ගලික අංශයේ ආයතන· ප්‍රධානීන් හා විද්වතුන්, විවිධ වෘත්තීන්ට අදාල වෘත්තිය සමිති ප්‍රධානීන් , අනධ්‍යයන කාර්ය මණ්ඩලය ආශ්‍රිත වෘත්තීය සමිති ප්‍රධානීන් හා ශිෂ්‍ය සංවිධානවල නියෝජිත පිරිස් සමඟ සාකච්ඡා වාර අසූවක් (80) පමණ පවත්වන ලදුව ඉදිරිපත් වූ නිර්දේශ/යෝජනා/අදහස් ආශ්‍රිතව පහත නිර්දේශ ඉදිරිපත් කරමි.

## 2. නිර්දේශ

(අ) අප රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ දැනටමත් පවතින මානව හා භෞතික සම්පත් වඩාත් ප්‍රශස්තව භාවිතා කිරීම හරහා, මහා භාණ්ඩාගාරය වෙත කිසිදු ආකාරයක අමතර ප්‍රාග්ධන හෝ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා වැයබරක් ඇති නොවන පරිදි 2020 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන් ඇතුළත් කිරීමේ ධාරිතාව 25%කින් ඉහල නැංවීම (මෙමඟින් අමතර සිසුන් 7500 කට විශ්වවිද්‍යාල අධ්‍යාපන හිමිකම් සලසා දීමට ඉඩකඩ සැලසෙනු ඇත).

(ආ) දැනට විශ්වවිද්‍යාල තත්ත්වයට පත්ව නොමැති, එහෙත් උපාධි හා පශ්චාත් උපාධි ලබා දෙන තත්වයට පත්කළ හැකි, දැනටමත් පවතින භෞතික සම්පත් භාවිතා කරමින්, සහ මානව සම්පත් වල සුළු වර්ධනයක් සිදු කිරීම මඟින් නව විශ්වවිද්‍යාල ලෙසින්, නුවරඑළිය වන සම්පත් උසස් අධ්‍යාපන ආයතනය, දියතලාව මිනින්දෝරු උසස් අධ්‍යාපන ආයතනය, කොළඹ සමාජ සේවා උසස් අධ්‍යාපන ආයතනය, පිටිපන පිහිටි නැනෝ තාක්ෂණ ඇකඩමිය, කොළඹ පිහිටි ITI උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනය සහ AAT තාක්ෂණික ශිල්ප උසස් අධ්‍යාපන ආයතනය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාලනය වන

විශ්වවිද්‍යාල බවට උසස් කිරීම. (මෙමඟින් 2020 අධ්‍යාපන වර්ෂයේ සිට අමතර සිසුන් 2500 කට උසස් අධ්‍යාපන වරම් ලබා දීමට ඉඩකඩ සැලසෙනු ඇත.)

(ඇ) මේ වන විට සහතික පත්‍ර /ඩිප්ලෝමා /උසස් ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යනු ලබන රජය සතු උසස් අධ්‍යාපන ආයතන හා කාර්මික තාක්ෂණ ආයතන සියල්ල (කිසි කලෙක උපාධිය ප්‍රදානය කරනු නොලබන, එහෙත් විශ්වවිද්‍යාල ප්‍රවේශ NVQ 6 දක්වා වූ අධ්‍යයන පහසුකම් සලසන) විශ්වවිද්‍යාල විද්‍යාතන බවට,(University Collage) පත් කිරීමට (කිසිදු ආකාරයකින් මහා භාණ්ඩාගාරය වෙත අමතර වැය බරක් ඇති නොවන පරිදි,) දැනට පවතින යටිතල පහසුකම් පමණක් භාවිතා කරමින් එහෙත් විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා වූ කාර්ය මණ්ඩල නව වැටුප් ව්‍යුහයක් හඳුන්වා දීම මඟින් සිදු කිරීම.

මෙම විශ්වවිද්‍යාල විද්‍යාතන විසින් පාඨමාලා සඳහා සහන ගාස්තු ක්‍රමයක් හඳුන්වා දීම මඟින් යෝජිත කාර්ය මණ්ඩල වැටුප් සඳහා අවශ්‍ය කරන අමතර මූල්‍ය අවශ්‍යතාව සම්පාදනය කිරීමට අපේක්ෂා කරමි.

## 3. අනුමැතිය

ඒ අනුව ඉහත අරමුණු කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන වෘත්තීය අභිමුඛ නව පාඨමාලා හඳුනා ගැනීම හා අදාල පද්ධතිය නැවත හඳුන්වා දියයුතු ප්‍රමිතීන් සහ ගුණාත්මක නියාමන ක්‍රමවේදයන් පිළිබඳව අධ්‍යයන කොට සති 06ක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීම පිණිස පහත දැක්වෙන විද්වත් කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි.

1. උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයේ ලේකම් - සභාපති
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති - සාමාජික
3. ශ්‍රී ජයවර්ධනපුර/ කොළඹ/ රුහුණ/ මොරටුව විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් - සාමාජික
4. NSBM හරිත විශ්වවිද්‍යාලයේ උපකුලපති - සාමාජික
5. වෘත්තිකයන්ගේ සංගමයේ සභාපති - සාමාජික
6. SLSCOM ආයතනයේ සභාපති - සාමාජික
7. අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ සංගමය - සාමාජික
8. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහත්මා - සාමාජික
9. විශ්වවිදයාල/ උසස් අධ්‍යාපන ආයතන සඳහා පත්කළ නිසිබලධාරීන් - සාමාජික

ආචාර්ය බන්දුල ගුණවර්ධන
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය

2019 දෙසැම්බර් මස 24 දින